මාධ්‍ය නිවේදනය
ஊடக வெளியீடு
PRESS RELEASE

Tel : 011 2 386572 Fax : 011 2 333717
ජනාධිපති මාධ්‍ය අංශය,ජනාධිපති කාර්යාලය,කොළඹ 01
ஜனாதிபதி ஊடகப் பிரிவு, ஜனாதிபதி அலுவலகம், கொழும்பு 01
President's Media Division, President's Office, Colombo 01

<u>සංශෝධිත නිවේදනය</u>

**නිවේදන අංක - 114**
**2020-05-16 පෙ.ව 11.00 ට**

**විදේශ සබඳතා අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා දූත මණ්ඩල COVID - 19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලට දායක වෙයි.**

විදේශ සබඳතා අමාත්‍යාංශය, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල මගින් සම්පාදනය කරගත් රුපියල් මිලියන 27.7ක් පසුගිය බ්‍රහස්පතින්දා (මැයි 14) ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙත පිළිගැන්වීය.

විදේශ ලේකම් රවීනාථ ආර්යසිංහ මහතා ජනාධිපති කාර්යාලයේ දී අදාළ චෙක්පත ජනාධිපතිතුමා වෙත භාර දුන්නේය. විදේශ සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා ද මේ අවස්ථාවට එක් විය.

විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවගේ සාමාජිකයන්, සංවිධාන සහ හිතුවන් තමන් මුහුණ පා සිටින විවිධ දුෂ්කරතා නොසලකා ප්‍රදර්ශනය කළ ඉමහත් කැපවීම ශ්‍රී ලංකාවේ පැතිර ගිය COVID – 19 වසංගතයේ හානිකර ප්‍රතිවිපාක සමනය කිරීම පිණිස රජය ගන්නා උත්සාහය අනුමත කිරීමකි.

විදේශ දූත කාර්යාල අරමුදල් රැස් කිරීමට අමතරව මේ අවස්ථාවේ බෙහෙවින් අවශ්‍යව ඇති නෙබියුලයිසර්, ස්වසන ආධාරක යන්ත්‍ර, උෂ්ණ මාපක, පරීක්ෂණ උපකරණ ඇතුළු වෙනත් ආරක්ෂණ මෙවලම් විශාල තොගයක් ලෝකයේ විවිධ ප්‍රදේශවලින් සපයාගෙන පරිත්‍යාග කොට තිබේ.

ශ්‍රී ලංකා විදේශ සේවා සංගමය සිය සාමාජිකයන්ගෙන් එකතු කර ගත් රුපියල් මිලියන 2.8 ක් COVID - 19 අරමුදලට දායක වනු පිණිස මැයි 06 වැනිදා ජනාධිපති රාජපක්ෂ මැතිතුමා වෙත භාර දුන්නේය.

**ජනාධිපති මාධ්‍ය අංශය**

**2020-05-16**